74282

OL/2015/44-S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

44 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

නැටුම් (දේශීය) I, II
நடனம் (சுதேச) I, II
Dancing (Oriental) I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

## නැටුම් (දේශීය) I

**විශේෂ උපදෙස් :**

※ සියලු ම අයදුම්කරුවන් **I කොටසේ** ප්‍රශ්න **25** ට ම පිළිතුරු සැපයිය යුතු ය. එයට අමතර ව **II උඩරට** නර්තනය හෝ **III පහතරට** නර්තනය හෝ **IV සබරගමු** නර්තනය යන කොටස් **තුනෙන් එක් කොටසකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

※ **II, III** හා **IV** වන කොටස්වලින් කලවමේ ප්‍රශ්න තෝරා **නොගත යුතු ය.** ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසට දැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලි ව ලියා දැක්විය යුතු ය.

**සැලකිය යුතුයි:**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

### I කොටස

● අංක **1** සිට **10** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන තෝරන්න.

**1.** උඩරට, පහතරට සහ සබරගමු වන්නම් නර්තනයේ දී වඩාත් වැදගත් වන්නේ .............................. චලන වේ.
(1) සංචාරී (2) රිද්මයානුකූල (3) තාලානුකූල (4) ප්‍රකාශනාත්මක

**2.** කනට ඇසෙන මිහිරි හඬ .............................. ලෙස හැඳින්වේ.
(1) ශබ්ද (2) ඝෝෂා (3) නාද (4) දෝංකාර

**3.** කොහොඹා කළය සහ කාවඩි නැටුම් වඩාත් දැකිය හැක්කේ .............................. පෙරහැරේ දී ය.
(1) ඇසළ (2) මිහිඳු (3) සංඝමිත්තා (4) දුරුතු

**4.** ශාන්තිකර්මයක් සැලසුම් කිරීමේ දී, ප්‍රථමයෙන් .............................. ප්‍රධාන චාරිත්‍රයක් ලෙස සැලකේ.
(1) මඩු පේ කිරීම (2) තොට පේ කිරීම (3) කප් සිටුවීම (4) මල පේ කිරීම

**5.** විලම්භ ලයෙහි සිව්ගුණය .............................. වේ.
(1) අඩ මධ්‍ය (2) මධ්‍ය (3) අති විලම්භ (4) ධෘත

**6.** නර්තනයේ දී අංග, ප්‍රත්‍යාංග .............................. ලෙස ශරීර කොටස් වෙන් කොට දැක්වේ.
(1) උපාංග (2) ගුණාංග (3) ශරීරාංග (4) පංචාංග

**7.** පිරිසක් එකතුව වාදනය කරන අවනද්ධ භාණ්ඩයක් ලෙස .............................. නම් කළ හැක.
(1) ගැටබෙරය (2) බංකු රබාන (3) බටනලාව (4) තාලම්පට

**8.** "මේරුම් විරාජිත සමං" යනුවෙන් ගැයෙන්නේ .............................. ගායනයකි.
(1) ප්‍රශස්ති (2) ටීකා (3) නමස්කාර (4) සී පද

**9.** කෝලම් රඟමඬල හඳුන්වන්නේ .............................. නමිනි.
(1) අංගම් මඩුව (2) තානායම්පළ (3) යක්ගෙය (4) වීදිය

**10.** නර්තනයේ ප්‍රායෝගික කොටස් භාවිත කරන ආකාරය ලියා දැක්වීම .............................. යි.
(1) අංග රචනය (2) ප්‍රස්තාරකරණය (3) අනුකරණය (4) සංස්කරණය

[දෙවැනි පිටුව බලන්න.

**11.** මහනුවර දළදා පෙරහැරේ දැකිය හැකි උඩරට නර්තන සම්ප්‍රදායට අයත් විශේෂාංග මොනවා ද?
(1) උඩැක්කි, වේවැල් සහ වෙස් (2) උඩැක්කි, තෙල්මේ සහ වෙස්
(3) උඩැක්කි, පන්තේරු සහ වෙස් (4) පන්තේරු, වෙස් සහ තාලම්

**12.** බෙර ඇස සැකසීම සඳහා සිවියක් (හරක් බොක්ක) යොදා ගෙන ඇත්තේ,
(1) ගැටබෙරයට ය. (2) පහතරට බෙරයට ය.
(3) දඬු බෙරයට ය. (4) පොකුරු බෙරයට ය.

**13.** නර්තනයක් නිර්මාණය කිරීමේ දී වේදිකාවේ අවකාශය පිළිබඳ වඩාත් අවධානය යොමු කළ යුතු වන්නේ,
(1) නර්තන ශිල්පීන් සඳහා ය. (2) පසුතල නිර්මාණ සඳහා ය.
(3) බෙර වාදන ශිල්පීන් සඳහා ය. (4) ගායන ශිල්පීන් සඳහා ය.

**14.** 
බෙන්තර ගලපාත විහාරයේ ඇති මෙම රූපය කැටයම් කර ඇත්තේ,
(1) අනුරාධපුර යුගයේ දී ය.
(2) ගම්පල යුගයේ දී ය.
(3) දඹදෙණි යුගයේ දී ය.
(4) කෝට්ටේ යුගයේ දී ය.

**15.** "විහාර දේවාලවල තේවාව සඳහා නියම වූ කුලවලින් පැමිණ කළගෙඩි සෙල්ලමේ යෙදෙන නළඟනෝ වෙති."
මෙම සටහන කරන ලද්දේ,
(1) ඉබන් බතූතා ය. (2) පාහියන් භික්ෂුව ය. (3) රොබට් නොක්ස් ය. (4) ස්පිල් බර්ජන් ය.

**16.** ගලිනා උලනෝවා සහ ඇනා පැව්ලෝවා යන කාන්තාවන් වඩාත් ජනප්‍රිය වූයේ,
(1) බැලේ රංගනයට ය. (2) අංග රචනයට ය.
(3) සංගීත නිර්මාණයට ය. (4) රංග රචනයට ය.

**17.** 
A


B

**A** සහ **B** රූපවලින් දැක්වෙන්නේ,
(1) වඩිග පටුන සහ දෙවොල් ය.
(2) වඩිග පටුන සහ ලිච්ඡවි ය.
(3) ලිච්ඡවි සහ දෙවොල් ය.
(4) වඩිග පටුන සහ තෙල්මේ ය.

**18.** 19 වන සියවසේ වඩාත් ප්‍රසිද්ධියට පත් බැලේ නාට්‍ය වශයෙන් සැලකෙන්නේ,
(1) අව්රෝරා කුමාරයා ය. (2) හංසවිල ය.
(3) ගිසෙල්ලි ය. (4) රෝමියෝ ජුලියට් ය.

● ප්‍රශ්න අංක **19** සිට **21** තෙක් නිවැරදි පිළිතුර පහත වගුව ඇසුරෙන් තෝරන්න.

| පේළිය | A තීරුව | B තීරුව | C තීරුව |
|---|---|---|---|
| 1. | ඉල්ලම් | අස්න | ඉල්ලම් මුදු |
| 2. | තෙල්මේ | කොහොඹා කංකාරිය | පුහුල |
| 3. | බලි ශාන්තිකර්මය | මුදුන්තාලය | දෙවොල් මඩුව |

**19.** දේශීය නර්තන සම්ප්‍රදායන් තුනට ම පොදු වූ ශාන්තිකර්මය සඳහන් වන්නේ,
(1) 1 පේළියේ A තීරුවේ ය. (2) 2 පේළියේ B තීරුවේ ය.
(3) 3 පේළියේ C තීරුවේ ය. (4) 3 පේළියේ A තීරුවේ ය.

**20.** දවුලේ දක්නට ඇති සුවිශේෂ කොටස් ඇතුළත් වන්නේ,
(1) 1 පේළියේ A හා C තීරුවල ය. (2) 2 පේළියේ A හා B තීරුවල ය.
(3) 2 පේළියේ B හා C තීරුවල ය. (4) 3 පේළියේ A හා C තීරුවල ය.


[තුන්වැනි පිටුව බලන්න.


**21.** සබරගමු නර්තන අංගයක් ඇතුළත් වන්නේ,
(1) 1 පේළියේ A තීරුවේ ය. (2) 2 පේළියේ B තීරුවේ ය.
(3) 1 පේළියේ C තීරුවේ ය. (4) 3 පේළියේ B තීරුවේ ය.

**22.** කේරළ කලා මණ්ඩලම් හි ඉගැන්වෙන නර්තන සම්ප්‍රදාය වන්නේ,
(1) කථක් ය. (2) කථකලි ය. (3) භරත ය. (4) මණිපුරි ය.

**23.** හිරාගම සෞන්දර්ය ගුරු විද්‍යාලය ආරම්භ කරන ලද්දේ,
(1) 1943 වර්ෂයේ දී ය. (2) 1972 වර්ෂයේ දී ය. (3) 1975 වර්ෂයේ දී ය. (4) 1978 වර්ෂයේ දී ය.

**24.**


A


B

ඉහත **A** සහ **B** රූපවලින් දැක්වෙන්නේ,
(1) වීර රසය සහ ශෘංගාර රසයයි. (2) කරුණ රසය සහ භීබත්ස්‍ය රසයයි.
(3) වීර රසය සහ භයානක රසයයි. (4) කරුණ රසය සහ ශාන්ත රසයයි.

**25.** පිළිවෙළින් කෝලම් හා සොකරි නාටකයේ එන චරිත වන්නේ,
(1) ජසයා සහ ලෙන්චිනා ය. (2) පුරංසිනා සහ ලෙන්චිනා ය.
(3) සොකරි සහ ලෙන්චිනා ය. (4) ජසයා සහ ගුරුහාමි ය.

## II කොටස - උඩරට නර්තනය

**26.** සාම්ප්‍රදායික උඩරට නර්තනය ප්‍රචලිත ප්‍රදේශ වන්නේ,
(1) සත් කෝරළය, සතර කෝරළය සහ මහනුවර වේ.
(2) සත් කෝරළය, සතර කෝරළය සහ පස්දුන් කෝරළය වේ.
(3) සතර කෝරළය, තුන් කෝරළය සහ පස්දුන් කෝරළය වේ.
(4) සතර කෝරළය, හාරිස්පත්තුව සහ සල්පිටි කෝරළය වේ.

**27.** උඩරට වෙස් ඇඳුම් කට්ටලයට අයත් ආභරණ කිහිපයක් වන්නේ,
(1) දෙවල්ල, පායිම්පත සහ රහුකුට්ටම් වේ. (2) උල්උඩය, හගල සහ හැඩකැල්ල වේ.
(3) සිඛාබන්ධනය, පායිම්පත සහ අවුල්හැරය වේ. (4) පායිම්පත, ගෙජ්ජි සහ හැඩකැල්ල වේ.

**28.** කොහොඹා කංකාරිය ශාන්තිකර්මයේ අන්තර්ගත නර්තන අංග ලෙස සැලකෙන්නේ,
(1) ආවැන්දුම සහ දේව කෝල්පාඩුව ය. (2) අස්නේ සහ ආවැන්දුම ය.
(3) අස්නේ සහ දෙවොල් ය. (4) කෝල්පාඩුව සහ තුන්තාලය ය.

**29.** කුඳ කුජිගත වට්ටම නටනු ලබන්නේ,
(1) මාත්‍රා 12 / 1234 දෙතිතට ය. (2) මාත්‍රා 123 / 1234 දෙතිතට ය.
(3) මාත්‍රා 1234 / 1234 දෙතිතට ය. (4) මාත්‍රා 123 / 123 තනිතිතට ය.

**30.** "තත් ............ තකරොං ........... තක්කට කුඳ තක රොං" යන්නෙහි හිස්තැන්වලට ගැළපෙන පද කොටස් තෝරන්න.
(1) තකට - ජිං (2) තකට - තක්කට (3) තකට - දොංතක (4) තකට - ජිකට

**31.** උඩරට නර්තන සම්ප්‍රදායට අයත් වන්නම් දෙකකි,
(1) සිංහරාජ සහ තුරඟා. (2) සිංහරාජ සහ විරාඩි.
(3) සිංහරාජ සහ කුදරඩි. (4) විරාඩි සහ කුදරඩි.

**32.** "සත්වෙත් මහත් අදර ලත්යුත් සිදත් කුමරු ................. " මෙම කවි පදයේ ඉතිරි කොටස වන්නේ,
(1) ගෙන එදින අසුගෙ පිට නැංගා, යන්නයි. (2) යන්නෙත් තොසින් තිදෙන සමගා, යන්නයි.
(3) ගත් සිත් තොසත් පැවිදි අංගා, යන්නයි. (4) ගං තෙරට පත් වූනිය එමගා, යන්නයි.

[හතරවැනි පිටුව බලන්න.

**33.** කොහොඹා කංකාරිය ශාන්තිකර්මයට ආවේණික නාට්‍යමය පෙළපාලි වන්නේ,
(1) ගුරුගේ මාලාව සහ හත් පදය වේ. (2) ගුරුගේ මාලාව සහ කෝල්පාඩුව වේ.
(3) හත් පදය සහ යක්කම් වේ. (4) ගුරුගේ මාලාව සහ යක්කම් වේ.

**34.** "දොං දොං ජිං ජිං ගජිගත ................." මෙම බෙර පදයට අයත් තිත් රූපය වන්නේ,
(1) මාත්‍රා 2 + 3 දෙතිත ය. (2) මාත්‍රා 2 + 4 දෙතිත ය.
(3) මාත්‍රා 3 + 3 තනිතිත ය. (4) මාත්‍රා 3 + 4 දෙතිත ය.

**35.** උඩරට නර්තන සම්ප්‍රදායට අයත් පාරිභාෂික වචන කිහිපයක් වන්නේ,
(1) කස්තිරම, සීරුමාරුව සහ ආවැන්දුම වේ. (2) මණ්ඩිය, කස්තිරම සහ කලාසම වේ.
(3) පා සරඹ, වන්නම් සහ අඩව්ව වේ. (4) සීරුමාරුව, පා සරඹ සහ ඉරට්ටිය වේ.

**36.** ගැටබෙරයෙහි කොටස් දෙකක් වන්නේ,
(1) වලයම සහ සුරත් තට්ටුව ය. (2) වෙනිවර සහ සුරත් තට්ටුව ය.
(3) කැපුම්හම සහ ඉල්ලම් ය. (4) සුරත් තට්ටුව සහ ඉල්ලම් ය.

**37.** "තත්ත තරි තරි තතරි තරි තරි ..............." මෙය,
(1) කස්තිරමකි. (2) සීරුමාරුවකි. (3) අඩව්වකි. (4) වට්ටමකි.

**38.** කුවේණියගේ ශාපයෙන් රෝගාතුර වූයේ,
(1) මලය රජු ය. (2) විජය රජු ය.
(3) ගජබා රජු ය. (4) පඬුවස්දෙව් රජු ය.

**39.** කොහොඹා කංකාරියේ පුද ලබන ප්‍රධාන දෙවිවරු දෙදෙනකු වන්නේ,
(1) වීරමුණ්ඩ දෙවි සහ කන්දේ බණ්ඩාර දෙවි ය. (2) දෙවොල් දෙවි සහ වීරමුණ්ඩ දෙවි ය.
(3) දැඩිමුණ්ඩ දෙවි සහ සමන් දෙවි ය. (4) කන්දේ බණ්ඩාර දෙවි සහ දෙවොල් දෙවි ය.

**40.** සෞන්දර්ය ආයතනයේ කථිකාචාර්යවරයකු වශයෙන් උඩරට නර්තනය ඉගැන්වූ ප්‍රවීණ ශිල්පියෙකි,
(1) කේ. එස්. ප්‍රනාන්දු. (2) අර්නොලිස් ඉඹුල්ගොඩ.
(3) කුලසිරි බුදවත්ත. (4) ප්‍රේමකුමාර එපිටවෙල.

## III කොටස - පහතරට නර්තනය

**26.** සාම්ප්‍රදායික පහතරට නර්තනය ප්‍රචලිත ප්‍රදේශ වන්නේ,
(1) රයිගම, මාතර සහ බෙන්තර වේ. (2) රයිගම, හොරණ සහ බදුල්ල වේ.
(3) මාතර, බෙන්තර සහ රත්නපුර වේ. (4) මාතර, බෙන්තර සහ බලංගොඩ වේ.

**27.** පහතරට තෙල්මේ ඇඳුම් කට්ටලයට අයත් ආභරණ කිහිපයක් වන්නේ,
(1) පබළු හැට්ටය, කාඟුල් සහ රහු වේ. (2) පබළු හැට්ටය, සේලය සහ තෝඩුපත් වේ.
(3) පබළු හැට්ටය, නළල් පටිය සහ තෙල් කච්චිය වේ. (4) පබළු හැට්ටය, තෝඩුපත් සහ රහු වේ.

**28.** දෙවොල් මඩු ශාන්තිකර්මයේ අන්තර්ගත නර්තන අංග ලෙස සැලකෙන්නේ,
(1) දෙවොල්, ගිරිදේවි සහ තෙල්මේ ය. (2) දෙවොල්, තෙල්මේ සහ යහන් දැක්ම ය.
(3) තෙල්මේ, පත්තිනි සහ ගිරිදේවි ය. (4) තෙල්මේ, දෙවොල් සහ වඩිග පටුන ය.

**29.** ගුද ගති ගත වට්ටම නටනු ලබන්නේ,
(1) මාත්‍රා 12 / 1234 දෙතිතට ය. (2) මාත්‍රා 123 / 1234 දෙතිතට ය.
(3) මාත්‍රා 1234 / 1234 තනිතිතට ය. (4) මාත්‍රා 12 / 12 තනිතිතට ය.

**30.** "රිම් ගතම් ............... ගත්ත ගත .............. ගුං" යන්නෙහි හිස්තැන්වලට ගැළපෙන පද කොටස් තෝරන්න.
(1) දොම් දොම් - ගදිත (2) ගති ගතම් - ගදිත
(3) දැහිං ගතම් - ගද් දිත්තකු (4) ගහිති ගතම් - ගදි දිතගත

**31.** පහතරට නර්තන සම්ප්‍රදායට අයත් වන්නම් දෙකකි,
(1) හනුමන්තා තාලය සහ නාතිලිංචි තාලය. (2) හනුමන්තා තාලය සහ දෙතාලය.
(3) නාතිලිංචි තාලය සහ ගංගාදි තාලය. (4) නාතිලිංචි තාලය සහ මේඝ තාලය.

**32.** "ගෙන අතින සිරිවැසය - තඹ පැහැය බබළමින් .............." මෙම කවි පදයේ ඉතිරි කොටස වන්නේ,
(1) පෙර දිගින් හිරු දෙවිඳු - බැස ඔබට සෙත දෙමින්, යන්නයි.
(2) නැගී තුරඟ වාහනය - තුරු ඉඹුල් සෙවනතින්, යන්නයි.
(3) මිණි ඔටුණු හිස දරා - කොකුම් බත් රුති වෙමින්, යන්නයි.
(4) පෙර දිගින් හිරු දෙවිඳු - කොකුම් බත් රුති වෙමින්, යන්නයි.

[පස්වැනි පිටුව බලන්න.

**33.** දෙවොල් මඩු ශාන්තිකර්මයට ආවේණික නාට්‍යමය පෙළපාළි වන්නේ,
(1) දෙවොල් ගොඩ බැසීම සහ තෙල්මේ නැටීම වේ. (2) දෙවොල් ගොඩ බැසීම සහ සළුපාලිය වේ.
(3) අඹ විදමන සහ දෙවොල් නැටීම වේ. (4) අඹ විදමන සහ දෙවොල් ගොඩ බැසීම වේ.

**34.** "දොං දොංගත ගත් දිත්තකු ........" මෙම බෙර පදයට අයත් තිත් රූපය වන්නේ,
(1) මාත්‍රා $2+3$ දෙතිත ය. (2) මාත්‍රා $2+4$ දෙතිත ය.
(3) මාත්‍රා $3+3$ දෙතිත ය. (4) මාත්‍රා $3+4$ දෙතිත ය.

**35.** පහතරට නර්තන සම්ප්‍රදායට අයත් පාරිභාෂික වචන කිහිපයක් වන්නේ,
(1) ඉරට්ටිය, ඉලංගම් සහ කවිතාල වේ. (2) ඉරට්ටිය, කලාසම සහ කවිතාල වේ.
(3) ඉලංගම්, කලාසම සහ සීරුමාරුව වේ. (4) කලාසම, ඉරට්ටිය සහ සීරුමාරුව වේ.

**36.** පහතරට බෙරයෙහි කොටස් දෙකක් වන්නේ,
(1) වෙනිවර සහ සුරත් තට්ටුව ය. (2) හයි තට්ටුව සහ වෙනිවර ය.
(3) කැපුම්හම සහ බෙර පුහුල ය. (4) හයි තට්ටුව සහ සුරත් තට්ටුව ය.

**37.** "ගතිකිට ගතදොං ගුගුද තරි ............." මෙය,
(1) අඩව්වකි. (2) කලාසමකි. (3) ඉරට්ටියකි. (4) අන්තාදියකි.

**38.** දෙවොල් මඩු පුරාවෘත්තයට අනුව හිසරදයකින් පෙළුණු බව කියවෙන රජු වන්නේ,
(1) පඬි රජු ය. (2) පඬුවස්දෙව් රජු ය.
(3) මලය රජු ය. (4) සේරමාන් රජු ය.

**39.** දෙවොල් මඩුවේ පුද ලබන ප්‍රධාන දෙවිවරු දෙදෙනකු වන්නේ,
(1) පත්තිනි දෙවි සහ දෙවොල් දෙවි ය. (2) පත්තිනි දෙවි සහ කඩවර දෙවි ය.
(3) දෙවොල් දෙවි සහ දැඩිමුණ්ඩ දෙවි ය. (4) සමන් දෙවි සහ නාථ දෙවි ය.

**40.** සෞන්දර්ය ආයතනයේ කථිකාචාර්යවරයකු වශයෙන් පහතරට නර්තනය ඉගැන්වූ ප්‍රවීණ ශිල්පියෙකි,
(1) ජේ. ඊ. සේදරමන්. (2) කේ. එස්. ප්‍රනාන්දු.
(3) ගලුකාගම හීන් නිලමේ. (4) සන්දෝරිස් ජයන්ත.

## IV කොටස - සබරගමු නර්තනය

**26.** සාම්ප්‍රදායික සබරගමු නර්තනය ප්‍රචලිත ප්‍රදේශ වන්නේ,
(1) රත්නපුර, බලංගොඩ සහ කලවාන වේ. (2) රත්නපුර, බලංගොඩ සහ හාරිස්පත්තුව වේ.
(3) රත්නපුර, කලවාන සහ සීනිගම වේ. (4) කලවාන, සීනිගම සහ කුරුවිට වේ.

**27.** සබරගමු පබළු ඇඳුම් කට්ටලයට අයත් ආභරණ කිහිපයක් වන්නේ,
(1) රතු රෙද්ද, බන්දි වළලු සහ ජටා පටිය වේ.
(2) රතු රෙද්ද, ජටාව සහ ජටා පටිය වේ.
(3) පබළු හැට්ටය, නෙත්තිමාලය සහ අත්පොටවල් හතර වේ.
(4) පබළු හැට්ටය, නෙත්තිමාලය සහ පායිම්පත වේ.

**28.** පහන් මඩු ශාන්තිකර්මයේ අන්තර්ගත නර්තන අංග ලෙස සැලකෙන්නේ,
(1) යහන් දැක්ම සහ ශුද්ධ මාත්‍රය ය. (2) යහන් දැක්ම සහ දේව කෝල්පාඩුව ය.
(3) මඩුපුරය සහ කෝල්පාඩුව ය. (4) මල්මඩුපුරය සහ කෝල්පාඩුව ය.

**29.** ගමන් මාත්‍රය නටනු ලබන්නේ,
(1) මාත්‍රා 12 / 1234 දෙතිතට ය. (2) මාත්‍රා 123 / 1234 දෙතිතට ය.
(3) මාත්‍රා 1234 / 1234 තනිතිතට ය. (4) මාත්‍රා 123 / 123 තනිතිතට ය.

**30.** "ජිමිත් .......... තකට ........" යන්නෙහි හිස්තැන්වලට ගැළපෙන පද කොටස් තෝරන්න.
(1) තක්කිට - තක්කිට කිට (2) තක්කිට - ජිංතක
(3) ජිංකිට - තකට (4) ජිංකිටි - තත් කිටිතක

**31.** සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් වන්නම් දෙකකි,
(1) විරාඩි සහ සැව්ලා. (2) විරාඩි සහ ගජගා.
(3) හනුමා සහ සිංහරාජ. (4) කොවුලා සහ සිංහරාජ.

**32.** "සත්තෙන් රජුන් පොරණ ගත්තෙන් රැගුම් කරන .........." මෙම කවි පදයේ ඉතිරි කොටස වන්නේ,
(1) කියන් කවි දැන එතන වාඩි, යන්නයි. (2) එක් තැන් වෙමින් පද දරා, යන්නයි.
(3) ඇත්තෙන් කිවිනි පිරිවරා, යන්නයි. (4) එතන සිටි පැවැති රඟ නාඩි, යන්නයි.

**33.** පහත් මඩු ශාන්තිකර්මයට ආවේණික නාට්‍යමය පෙළපාලි වන්නේ,
(1) අඹ විදමන සහ ඌරා යක්කම වේ. (2) දෙවොල් ගොඩ බැසීම සහ ඌරා යක්කම වේ.
(3) පොත්කඩේ යක්කම සහ මරා ඉපැද්දීම වේ. (4) පොත්කඩේ යක්කම සහ රාමා යක්කම වේ.

**34.** " ජීවිත කුදා දොම් .........." මෙම දවුල් පදය අයත් තිත් රූපය වන්නේ,
(1) මාත්‍රා 3 + 4 දෙතිත ය. (2) මාත්‍රා 4 + 4 තනිතිත ය.
(3) මාත්‍රා 2 + 4 දෙතිත ය. (4) මාත්‍රා 3 + 3 තනිතිත ය.

**35.** සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් පාරිභාෂික වචන කිහිපයක් වන්නේ,
(1) කොලොන්න පද, මුදුන්තාලය සහ කලාසම වේ.
(2) කොලොන්න පද, මුදුන්තාලය සහ කස්තිරම වේ.
(3) ඉරට්ටිය, අඩව්ව සහ සීරුමාරුව වේ.
(4) කස්තිරම, සීරුමාරුව සහ අඩව්ව වේ.

**36.** දවුලෙහි කොටස් දෙකක් වන්නේ,
(1) මණ්ඩම සහ තට්ටුව ය. (2) ගැටිය සහ තට්ටුව ය.
(3) ගැටිය සහ සුරත් තට්ටුව ය. (4) ගැටිය සහ කයිපුඩිවළල්ල ය.

**37.** "ගත්තකු ජිත්තත් - දොංගඩ තරිකිට ජිත් තත් ......." මෙය,
(1) කස්තිරමකි. (2) සීරුමාරුවකි.
(3) අඩව්වකි. (4) කලාසමකි.

**38.** පහත් මඩු පුරාවෘත්තයට අනුව හිසරදයකින් පෙළුණු බව කියවෙන රජු වන්නේ,
(1) පඬි රජු ය. (2) පඬුවස්දෙව් රජු ය. (3) මලය රජු ය. (4) සේරමාන් රජු ය.

**39.** පහත් මඩුවේ පුද ලබන ප්‍රධාන දෙවිවරු දෙදෙනකු වන්නේ,
(1) පත්තිනි දෙවි සහ දෙවොල් දෙවි ය. (2) පත්තිනි දෙවි සහ කඩවර දෙවි ය.
(3) දෙවොල් දෙවි සහ දැඩිමුණ්ඩ දෙවි ය. (4) සමන් දෙවි සහ නාථ දෙවි ය.

**40.** සෞන්දර්ය ආයතනයේ කථිකාචාර්යවරයකු වශයෙන් සබරගමු නර්තනය ඉගැන්වූ ප්‍රවීණ ශිල්පියෙකි,
(1) ජේ. ඊ. සේදරමන්. (2) රද්දැල්ලේ පොඩි මහත්තයා.
(3) එස්. එල්. එච්. ප්‍රනාන්දු. (4) සන්දෝරිස් ජයන්ත.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**44 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

නැටුම් (දේශීය) I, II
நடனம் (சுதேச) I, II
Dancing (Oriental) I, II

## නැටුම් (දේශීය) II

* **පළමුවැනි** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** සියලු ම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ **අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.**

(i) ලී කැටයමින් කළ නළඟනකගේ රූපය දැකිය හැක්කේ ................................ දේවාලයේ දී ය.

(ii) රාජ ආඥාවක් සන්නිවේදනය කිරීමට අතීතයේ දී ................................ වාදනය කරන ලදී.

(iii) වේශ නිරූපණය අයත් වන්නේ සතර අභිනයෙන් ................................ අභිනයට ය.

(iv) මිනිස් චරිත හා අතිමානුෂ චරිත යොදා ගනු ලබන්නේ ................................ නාටකයේ දී ය.

(v) xiv වන ලුවී රජ ................................ රංග කලාවේ පුරෝගාමියා ලෙස සැලකේ.

(vi) කරදිය මුදා නාට්‍යයේ සිසීගේ චරිතයට රංගන දායකත්වය ලබා දුන්නේ................................ නර්තන ශිල්පිණියයි.

(vii) බණ්ඩාර දෙවි සත් කට්ටුව හා වැදි යකුන් පුද ලබන්නේ ................................ ශාන්තිකර්මයේ දී ය.

(viii) ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රාජ්‍ය සමයේ වන්නම්, ප්‍රශස්ති, හටන් කවි ගායනා කරන ලද්දේ ................................ මඩුවේ දී ය.

(xi) පහත සඳහන් නර්තනාංග අයත් භාරතීය නර්තන සම්ප්‍රදායයන් නම් කරන්න.
(අ) අලාරිප්පු ................................
(ආ) පරන් ................................

(x) සිරිබෝහාමි, නිත්තවෙල ගුණයා යන ශිල්පීන් වඩාත් ප්‍රසිද්ධියට පත් වූ නර්තන සම්ප්‍රදායයන් නම් කරන්න.
(අ) සිරිබෝහාමි ................................
(ආ) නිත්තවෙල ගුණයා ................................

**2.** (i) මාත්‍රා තුනේ (123 / 123) තනිතිතට අයත් බෙර පදයක් ප්‍රස්තාරගත කරන්න.
(ii) මාත්‍රා 2 + 4 තාල රූපයට අයත් වන්නමක/සින්දු වන්නමක කවි පදයක් ප්‍රස්තාරගත කරන්න.
(iii) මාත්‍රා 3 + 4 තාල රූපයට අයත් කස්තිරමක්/ඉරට්ටියක්/කලාසමක් ප්‍රස්තාරගත කරන්න.

**3.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.
(i) මණ්ඩිය (ii) ග්‍රහපංති
(iii) උඩැක්කිය (iv) දේශීය අවනද්ධ භාණ්ඩ
(v) වන්නම්

**4.** දේශීය ශාන්තිකර්ම ගත් කල පොදු ව්‍යුහයන් හා අන්තර්ගත සිද්ධීන් හි සහසම්බන්ධතාවක් ඇති බව පිළිගත හැකි ය.
(i) පහන් මඩුවේ හා දෙවොල් මඩුවේ එන නාට්‍යමය අවස්ථා **දෙක** බැගින් වෙන් කොට ලියන්න.
(ii) යක් ඇනුම නර්තනය හෝ දෙවොල් නර්තනය හෝ පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.
(iii) කොහොඹා කංකාරිය, දෙවොල් මඩුව, පහන් මඩුව යන ශාන්තිකර්මවල එන පුරාවෘත්තවලින් කියැවෙන සිද්ධිවල සමාන අසමානතා විමසුමට ලක් කරන්න.

**5.** ජන නැටුම් හා ජන නාටක ජීවිතය විදහා දක්වන කලාංග වේ.

(i) මෝල්ගස් හෝ කඩු හෝ රබන් හෝ කවියක් ලියන්න.

(ii) සොකරි නාටකය පැවැත්වීමේ අරමුණු කෙටියෙන් විස්තර කරන්න.

(iii) ජස ලෙන්චිනා කෝලම ඇසුරෙන් ජන ජීවිතය විවරණය වන ආකාරය විමසුමට ලක් කරන්න.

**6.** පහත රූපරාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



**A**



**B**



**C**

(i) **A** රූපයෙහි දැක්වෙන නර්තන සම්ප්‍රදාය සහ රංගවස්ත්‍රාභරණ **දෙකක්** නම් කරන්න.

(ii) **B** රූපයෙහි දැක්වෙන නර්තන සම්ප්‍රදාය සහ වේශනිරූපණ ක්‍රම **දෙකක්** ලියා දක්වන්න.

(iii) **C** රූපයෙහි දැක්වෙන නර්තන සම්ප්‍රදායට අයත් වාද්‍ය භාණ්ඩ **දෙකක්** හඳුන්වන්න.

**7.** රූපවාහිනිය, නර්තන කලාවේ උන්නතියට මෙන් ම පරිහානියට ද හේතු වී ඇත.

(i) රූපවාහිනිය මගින් විකාශනය වන නර්තන වැඩ සටහන් **හතරක්** නම් කරන්න.

(ii) රූපවාහිනී නර්තන නිර්මාණයන්හි රංග වස්ත්‍රාභරණවල දේශීය අනන්‍යතා ලක්ෂණ පිළිබඳ විග්‍රහයක් කරන්න.

(iii) දේශීය නර්තන කලාවේ දියුණුව සඳහා රූපවාහිනිය යොදාගත හැකි ආකාරය පිළිබඳ ව ඔබේ යෝජනා ඉදිරිපත් කරන්න.

* * *

www.ehelpmate.com

Visit us to download
O/L & A/L Past Papers and Term Test Papers

පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර ලබා ගැනීම සඳහා
www.ehelpmate.com
වෙබ් අඩවියට පිවිසෙන්න.